# ඉ - ඉගෙනුම් පියස

# සුවෙන් පෙරට

## කලාප අධ්‍යාපන කාර්යාලය

## මිනුවන්ගොඩ

## 02. නිවස අවට වටපිටාවේ භූමියේ ස්වභාවය

මිනිසා තම වටපිටාවෙන් හා ආපදාවලින් බේරීම සඳහා සොර සතුරන්ගෙන් ආරක්ෂා වීම සඳහා ඉදිකර ඇති ස්ථානයක් නිවසක් ලෙස හැඳින්වෙයි. බොහෝ විට නිවස පිහිටා ඇත්තේ කඳුකර, වෙරළ තීර, තැනිතලා, බැවුම්, ගංගා, වනාන්තර වැනි භෞතික ලක්ෂණ සහිත ග්‍රාමීය, නාගරික හෝ වතු ආශ්‍රිත පරිසරයක විය හැක.

පිටු අංක 23 හි සඳහන් ක්‍රියාකාරකම කරන්න. ඔබේ නිවස අවට වටපිටාවේ භූමියේ ස්වභාවය නිරීක්ෂණය කර චිත්‍රයට නගන්න.

**නිවාස පිහිටා ඇති භූමියේ දක්නට ලැබෙන ලක්ෂණ හා එම ලක්ෂණ අනුව ඇති විය හැකි වාසි අවාසි**

| නිවස පිහිටි භූමියේ ස්වභාවය | ලක්ෂණ | වාසි | අවාසි |
|---|---|---|---|
| 01. ග්‍රාමීය පරිසරයක පිහිටි නිවාස | අවට ගස්කොළන් දක්නට ලැබීම, ගංගා ඇළ දොළ පිහිටා තිබීම, කුඹුරු දක්නට ලැබීම. | සිසිල් සුවදායී වාතාශ්‍රයක් පැවතීම, ගොවිබිම් වලින් නැවුම් එළවළු පලතුරු ලබා ගත හැකි වීම, පිරිසිදු ජලය තිබීම. | සේවා පහසුකම් අඩු වීම, ප්‍රවාහන පහසුකම් අඩු වීම, කාර්මික රැකියා අවස්ථා අඩු වීම |
| 02. වෙරළ ආශ්‍රිත පරිසරයක පිහිටි නිවාස | තැනිතලා බිමක් වීම, වැලි සහිත භූමියක් පැවතීම. | ධීවර කර්මාන්තය ආශ්‍රිත රැකියා සුලභ වීම, සංචාරක ව්‍යාපාරය සඳහා වැදගත් වීම, සිසිල් සුළං සහිත වාතාශ්‍රයක් පැවතීම. | සංචාරකයින් ගේ ජීවන රටාවට ආකර්ෂණීය වීමේ නැඹුරුතාව වැඩිවීම, මුහුදු රළ මගින් ඇතිවන බාධක වලට මුහුණ දීමට සිදු වීම (සුනාමි තත්ත්වයන්), ධීවර කර්මාන්තය සංචාරක කර්මාන්තය ආශ්‍රිත රැකියා හැරුණුවිට වෙනත් රැකියාවල නිරත වීම අඩුවීම, ස්ථිර වාසස්ථාන ගොඩ නැගීමේ අපහසුතාවය, ලෝහ ආශ්‍රිත ගෘහ භාණ්ඩ හා විද්‍යුත් උපකරණ ඉක්මනින් ඉවත් කිරීමට සිදුවීම (ලවණ ජලය නිසා ඉක්මනින්ම මල බැඳීම හේතුවෙන්) |

| | | | |
|---|---|---|---|
| 03. වතුකරයේ පිහිටි නිවාස | තේ රබර් වැනි වගාවන් අවට දක්නට ලැබීම | වතුකරය ආශ්‍රිත රැකියා පහසුකම් ලැබීම | ඒ ආශ්‍රිත රැකියා හැර වෙනත් රැකියාවලට ඇතිවීමේ හැකියාව අඩු වීම |
| 04. කඳුකර බිමක පිහිටි නිවාස | අවට කඳු බින් දක්නට ලැබීම, ශාක බහුල වීම | තේ රබර් වැනි වගාවන් ට සුදුසු වීම, ජල පෝෂක ප්‍රදේශ දක්නට ලැබීම | නායයෑම් වැනි ස්වභාවික ආපදාවන්ට ලක් වීමේ හැකියාව වැඩිවීම, මාර්ග පහසුකම් අඩු වීම |
| 05. තැනිතලා බිමක පිහිටි නිවාස | තැනිතලා බිම් දක්නට ලැබීම, කුඹුරු ගොවිබිම් දක්නට  ලැබීම | කෘෂිකර්මාන්තය සඳහා යෝග්‍ය වීම, නිවාස හා මාර්ග ඉදිකිරීම සඳහා යෝග වීම | නිතර ජල ගැලීම් වලට ලක්වීම |
| 06. බෑවුම් ප්‍රදේශයක පිහිටි නිවාස | අවට කඳු බිම් දක්නට ලැබීම, ශාක දක්නට ලැබීම | තේ රබර් වැනි වගාවන් සඳහා යෝග්‍ය වීම, පෝෂක ප්‍රදේශ දක්නට ලැබීම | මා යෑමෙනි ආපදාවන්ට ලක් වීම පාංශු බාදනයට ලක්වීම |
| 07. නාගරික පරිසරයක පිහිටි නිවාස | පුළුල් ප්‍රවාහන මාර්ග දක්නට ලැබීම, ගොඩනැගිලි බහුලවීම, ශාක ව්‍යාප්තිය අඩු වීම | හොඳ ප්‍රවාහන පද්ධතියක් පැවතීම, සේවා පහසුකම් බහුල වීම, රැකියා අවස්ථා බහුල වීම | පරිසර දූෂණය වැඩි වීම, අධික උෂ්ණත්වය, ජන ව්‍යාප්තිය අධිකවීම, සමාජීය ගැටලු වැඩිවීම |
| 08. මද උස් බිමක පිහිටි නිවාස | අවට කඳු වැටි දක්නට ලැබීම, ශාක ව්‍යාප්තියක් පැවතීම | බෝග වගාවන් සඳහා යෝග්‍ය වීම, සීත සුළං සහිත වාතාශ්‍රයක් ලැබීම | පාංශු බාදනය ඇතිවීම, නායයෑම් වලට ලක්වීමේ අවදානම |

# 6 ශ්‍රේණිය - භූගෝලය

නිවස පිහිටියේ කුමන භූමි ප්‍රදේශයක වුවද එම භූමිය ආරක්ෂා කර ගැනීම අප කාගේත් යුතුකමක් සේම වගකීමක්ද වේ. පහත දෑ මඟින් අපට භූමිය ආරක්ෂා කර ගත හැකි වේ.

- පාංශු ඛාදනය වැළැක්වීම සඳහා ගල්වැටි දැමීම, පිඩලි ඇල්ලීම, හෙල්මළු ක්‍රමයට කඳු බෑවුම්වල වගා කිරීම සිදුකල යුතුයි.
- ජල පෝෂක ප්‍රදේශ ආරක්ෂා කිරීම සඳහා ආවරණ වැවිලි වගාවන් සිදු කිරීම.
- දිරාපත් නොවන අපද්‍රව්‍ය භූමියට එක් කිරීම වෙනුවට අපද්‍රව්‍ය එක්රැස් කොට පුළුස්සා දැමීම හෝ ප්‍රතිශක්තිකරණය සඳහා යොමු කිරීම.
- ජලය බැස යන මාර්ග අවහිර නොකිරීම ඒ සඳහා ක්‍රමවත් කානු පද්ධතියක් සකස් කිරීම.
- ජලය බැස යාමට හැකිවන සේ පහත්බිම් ගොඩ කිරීමෙන් වැළකීම.
- ගොඩනැගිලි ඉදිකිරීමේදී භූමියට හානියක් නොවන සේ ඉදිකිරීම් කටයුතු සිදු කිරීම.
- කැලිකසල තැනින් තැන දැමීමෙන් වැළකීම ඒ සඳහා ක්‍රමවත් වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කිරීම.

## ශාක හා සතුන් විවිධත්වය

භූගෝලය පෙළ පොතේ ශාක හා සතුන් විවිධත්වයට අදාළ පිටු අංක 24 හා 25 හොඳින් කියවා පහත අභ්‍යාස වලට පිළිතුරු සපයන්න.

1. ශාක වර්ග සිටවීමට තෝරා ගැනීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු මොනවාද?
2. සංචාරක පක්ෂීන් ලෙස හඳුන්වන්නේ කවුරුන්ද?
3. සංචාරක පක්ෂීන්ට උදාහරණ දක්වන්න. එම කුරුලු විශේෂයන්ගේ රූප අඳින්න.
4. සතුන්ගෙන් ලැබෙන ප්‍රයෝජන හා පරිසරයට ඇතිවන බලපෑම් ලියන්න.
5. ඔබ නිවස අවට පරිසරයේ දක්නට ලැබෙන සත්ත්ව විශේෂ හා ශාක විශේෂ පිළිබඳ වෙන වෙනම හඳුන්වමින් පින්තූර අලවා හෝ ඇඳ කුඩා පොත් පිංචක් සකස් කරන්න.
6. පෙළ පොතේ පිටු අංක 26 හා 27 එහි ඇති ක්‍රියාකාරකමට පිළිතුරු සපයන්න.

## පාසල/ නිවස අවට වටපිටාවේ මානව ක්‍රියාකාරකම්

### පාසල හා නිවස අවට ප්‍රජාව හඳුනාගැනීම

ශ්‍රී ලංකාව තුළ සිංහල, දෙමළ, මුස්ලිම්, බර්ගර් හා මැලේ ආදී වශයෙන් විවිධ ජන වර්ග ජීවත් වනවා මෙන්ම ඔවුන් බෞද්ධ, හින්දු, කතෝලික, ඉස්ලාම් වැනි විවිධ ආගම් අදහනු ලබයි. එක් එක් ජාතීන්ට අනන්‍ය වූ සිරිත් විරිත් සමුදායක් පවතී. අප ජීවත් වන පරිසරය තුළ විවිධ ජන වර්ග සිටියද අප ඔවුන් සමග සහයෝගයෙන් මෙන්ම අන්‍යෝන්‍ය සහජීවනයෙන් ජීවත් වීමට පුරුදු විය යුතුය. ඒ සඳහා අප ඔවුන්ගේ සිරිත් විරිත් ආගම් හඳුනාගත යුතුයි.



සිංහල



දෙමළ



මුස්ලිම්



බර්ගර්

### ආගමික සංකේත



**ක්‍රියාකාරකම**

- පෙළ පොතේ 29 පිටුවෙහි ඇති ක්‍රියාකාරකම කරන්න.
- විවිධ ජන වර්ග වලට හා ආගම වලට අයත් උත්සව අවස්ථාවක් චිත්‍රයට නගන්න

# පාසල / නිවස අවට ආර්ථික කටයුතු

ප්‍රදේශයක පවතින සම්පත් මත එම ප්‍රදේශයේ ආර්ථික කටයුතු රඳා පවතී.

ආර්ථික කටයුතු

- කෘෂිකාර්මික කටයුතු
  - භෝග වගා කිරීම
  - සත්ත්වපාලනය
  - ධීවර කර්මාන්තය
- කාර්මික කටයුතු
- සේවාවන්

## 01.කෘෂිකාර්මික කටයුතු

විවිධ භූ ලක්ෂණ හා දේශගුණික ලක්ෂණවලින් යුත් අප රටේ විවිධ ප්‍රදේශවලට සුවිශේෂී වූ කෘෂිකාර්මික කටයුතු දක්නට ලැබේ.

### වියළි කලාපය

- වට්ටක්කා



- බඩඉරිඟු



- කොමඩු



## උතුරු ප්‍රදේශය

- මිරිස්



- ලූනු



- මිදි



## කඳුකර කලාපය

- කැරට්



- ලීක්ස්



- බීට්



## තෙත් කලාපය

- ගම්මිරිස්



- තක්කාලි



## වෙරළ තීරය

- සත්ත්වපාලනය





- ධීවර කර්මාන්තය



## ක්‍රියාකාරකම

01.වියළි කලාපයේ, තෙත් කලාපයේ හා කඳුකර ප්‍රදේශයේ වැවෙන එළවළු වර්ග දැක්වෙන වගුවක් සකසන්න.

| වියළි කලාපය | තෙත් කලාපය | කඳුකර ප්‍රදේශය |
|---|---|---|
| | | |

02.ඔබගේ ගෙවත්තේ භෝග වගා කිරීමට ඔබට දායක විය හැකි අවස්ථා 3ක් ලියන්න.

# 02. කාර්මික කටයුතු

සෑම ප්‍රදේශයකම විවිධ වූ කාර්මික කටයුතු දැකිය හැක. ඒවා කොටස් 2ක් යටතේ වර්ග කෙරේ.

**01. එම ප්‍රදේශයේ ඇති ස්වභාවික සම්පත් උපයෝගී කර ගනිමින් කරනු ලබන කර්මාන්ත.**

- මේවා නිවස අවට පරිසරයෙන් ලබා ගනු ලබන අමුද්‍රව්‍ය උපයෝගී කරනු ලබන කර්මන්ත වේ.

  උදා : මැටි උපයෝගී කරගෙන උළු, ගොඩොල් වැනි නිෂ්පාදන

  සිමෙන්ති උපයෝගී කරගෙන සිමෙන්ති ගල්, මල්පොච්චි වැනි නිෂ්පාදන

- තවද ගෘහ ආශ්‍රිතව කරනු ලබන කුඩා පරිමාණ කර්මන්තද මේ යටතට අයත් වේ.

  උදා : රස කැවිලි නිෂ්පාදන

  ඇඳුම් මැසීම

  සහල් ආශ්‍රිත නිෂ්පාදන

**02. පාරම්පරික ශිල්ප ඥානය පදනම් කරගෙන කරනු ලබන කර්මාන්ත**

උදා:

| කර්මන්තය | ප්‍රදේශ |
|---|---|
| ලී බඩු | මොරටුව |
| වෙස් මුහුණු | අම්බලන්ගොඩ |

## ක්‍රියාකාරකම

පිටු අංක 35ට අදාළ ක්‍රියාකාරකම කරන්න.

# 03.සේවා කටයුතු

පාසල හා නිවට වටපිටාවේ පවත්නා ආර්ථික කටයුතු අතර සේවා කටයුතු ද වැදගත් වේ. මිනිස් අවශ්‍යතා යම් ආයතනයක් මගින් ඉටු කරන්නේ නම් එය සේවාවක් ලෙස හැඳින්විය හැක.

ශ්‍රී ලංකාවේ පහත සඳහන් සේවාවන් දක්නට ලැබෙයි

- අධ්‍යාපන සේවාව
- තැපැල් සේවාව
- බැංකු සේවාව
- විදුලිබල සේවාව
- දූරකථන සේවාව
- සෞඛ්‍ය සේවාව
- ප්‍රවාහන සේවාව
- ආරක්ෂක සේවාව
- ජල සම්පාදන සේවාව
- පුස්තකාල සේවාව



**සපයන ආකාරය අනුව සේවාවන් පහත ආකාරයට වර්ග කළ හැක**

- රජය මගින් නොමිලේ සපයන සේවාවන්
- රජය මැදිහත්වී සහනදායි මිලකට ලබා දෙන සේවාවන්
- පෞද්ගලික අංශය මගින් ලබාදෙන සේවාවන්

| රජය මගින් නොමිලේ සපයන සේවාවන් | රජය මැදිහත්වී සහනදායි මිලකට ලබා දෙන සේවාවන් | පෞද්ගලික අංශය මගින් ලබාදෙන සේවාවන් |
|---|---|---|
| අධ්‍යාපනය<br>සෞඛ්‍ය<br>ආරක්ෂක (පොලිසිය, හමුදාව) | ප්‍රවාහන සේවාව<br>තැපැල්<br>විදුලි බල සේවාව<br>ජල සේවාව<br>රාජ්‍ය ඔසුසල් මගින් සහනදායි මිලකට ඖෂධ ලබාදීම | අධ්‍යාපනය (පෞද්ගලික පාසල් මගින්)<br>සෞඛ්‍යය (පෞද්ගලික රෝහල් මගින්)<br>ආරක්ෂක (පෞද්ගලික අංශයේ මගින්) |

## අප ප්‍රදේශයේ පවත්නා විවිධ සේවාවන් හා ඒවායින් ඉටු කරන කාර්යයන්

| **සේවාව** | **ඉටුකරන කාර්යය** |
|---|---|
| අධ්‍යාපන සේවාව | • පෙළපොත් අනුව වර්ෂයකට නියමිත පාඩම් මාලාව සිසුන්ට අවබෝධ කර දීම<br>• හොඳ සිරිත් කියාදීම<br>• සමාජ සාරධර්ම හුරුපුරුදු කිරීම<br>• සිසුන්ගේ දක්ෂතා හඳුනාගෙන ඒවා වැඩි දියුණු කර ගැනීමට අවශ්‍ය කටයුතු සැලසීම<br>• සමාජයේ හොඳ පුරවැසියකු බිහි කිරීම |
| බැංකු සේවාව | • මුදල් තැන්පත් කිරීම<br>• තැම්පත් කළ මුදල් නැවත අවශ්‍ය වූ විට ලබා ගැනීමට හැකි වීම<br>• ණය නිකුත් කිරීම<br>• අලුත් ගිණුම් ආරම්භ කිරීම<br>• රන් භාණ්ඩ ආරක්ෂා කිරීම |

| | |
|---|---|
| තැපැල් සේවාව | • මුද්දර නිකුත් කිරීම<br>• දේශීය විදේශීය ලියුම් භාර ගැනීම හා ඒවා අදාල ස්ථානවලට යැවීම<br>• මුදල් ඇණවුම් භාර ගැනීම<br>• ලියුම් ලියාපදිංචි කිරීම<br>• විදුලි පණිවිඩ යැවීම හා එවීම |

## ක්‍රියාකාරකම

01.ඉහත වගුව ආකාරයට ඔබ දන්නවා විවිධ සේවාවන් හා ඒවායින් ඉටු කරන කාර්යයන් දෙක බැගින් වගුගත කරන්න

02.පාසල් සිසුවෙකු වශයෙන් ඔබ භුක්ති විඳින සේවාවන් හතරක් නම් කරන්න

03.ඔබ ප්‍රදේශයේ ඇති රෝහල් බැංකු පාසල් රාජ්‍ය හා පෞද්ගලික ලෙස වර්ග කොට නම් කරන්න

| ආයතන | රාජ්‍ය ආයතනයේ නම | පෞද්ගලික ආයතනයේ නම |
|---|---|---|
| රෝහල් | | |
| බැංකු | | |
| පාසල් | | |

## පොදු සේවාවන් බුක්ති විඳීමේ දී අපට මුහුණ දීමට සිදුවන දුෂ්කරතාවන්

- තම වාරය එනතුරු ඉවසීමෙන් යුතුව බලා සිටීමට සිදු වීම
- නිලධාරීන්ට අවනත වී කටයුතු කිරීමට සිදු වීම
- පොදු සේවාවන් යටතේ ක්‍රියාත්මක වන නීති රීති වලට එකඟ වීම සිදුවීම
- පෝලිමේ සිටීමට සිදුවීම
- කාලය අපතේ යාම
- තමන්ට අවශ්‍ය වේලාවට වැඩේ නිම කරවා ගැනීමට නොහැකි වීම

පොදු සේවාවන් භුක්ති විඳීමේදී අපගෙන් ඉටුවිය යුතු යුතුකම් රාශියක් වෙයි කීපයක් පහතින් දැක්වේ

- පොදු දේපළ ආරක්ෂා කිරීම
- පොදු සේවාවන් යටතේ ක්‍රියාත්මක වන නීති රීති වලට ගරු කිරීම
- ආයතනයට ගරු කිරීම
- ලැබෙන සේවාව අගය කොට සැළකීම
- ලබන සේවාවෙන් උපරිම ප්‍රයෝජන ගැනීම

ඉහත යුතුකම් වලට අමතරව පොදු සේවාවන් භුක්ති විඳීමේදී ඔබගෙන් විය යුතු යුතුකම් මොනවාදැයි ලියා දක්වන්න.